# දිනන දකුණ

දක්ෂිණාංශික දේශපාලනය ප්‍රතිස්ථාපනය කිරීමේ සාමූහිකය.

මාධ්‍ය නිවේදනය

2026/05/06.

## සැක දුරු කිරීමට එකම විසඳුම මනෝවිද්‍යාත්මක පශ්චාත් මරණ පරීක්ෂණයක් (Psychological Autopsy) සිදු කිරීමයි.

රට තුළ මහත් ආන්දෝලනාත්මක තත්ත්වයක් ඇති කරමින්, මියගිය විදේශ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ සහකාර අධ්‍යක්ෂ රංග නිශාන්ත රාජපක්ෂ මහතාගේ මරණය සම්බන්ධයෙන් මාධ්‍ය හමු, පාර්ලිමේන්තු විවාද සහ සමාජ මාධ්‍ය හරහා එකිනෙකට පරස්පර විවිධ අදහස් සැක සංකා මතු කරමින් පවතියි.

විශේෂයෙන්ම කුලියාපිටිය වැඩ බලන මහේස්ත්‍රාත්වරයාගේ සහ සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ මීට අදාළ ලිපි දෙකක් පාර්ලිමේන්තුවේ සභාගත කර ඇත.

මෙම මරණය සම්බන්ධයෙන් අතිශය සංවේදී ඡායාරූපද මේ වන විට සමාජ මාධ්‍ය තුළ සංසරණය වෙමින් පවතී.

දිනන දකුණ සාමූහිකය විසින් මනෝවිද්‍යාත්මක පශ්චාත් මරණ පරීක්ෂණයක් (Psychological Autopsy) සිදු කරන ලෙස කරන ලද ඉල්ලීම යළි අවධාරණය කරනු කැමැත්තෙමු.

සියලු කරුණු සැලකිල්ලට ගැනීමේදී ඉතිහාසයේ සිදු වූ තවමත් නොවිසඳුණු වසීම් තාජුඩින් ඝාතන පරීක්ෂණය මෙන් මෙම මරණයද අතිශය සංකීර්ණ එකක් බවට පත්වනු ඇතැයි අපේ අදහස වේ.

මියගිය රංග නිශාන්ත රාජපක්ෂ මහතාගේ පවුලේ සාමාජිකයන්ට සාධාරණය ඉටු වීමටත්, ඩොලර් මිලියන 2.5 ක භාණ්ඩාගාර ගනුදෙනුවේ ස්වාධීන පරීක්ෂණ සඳහාත් මෙම මරණ පරීක්ෂණය ඍජු ලෙසම බලපාන බව අපගේ විශ්වාසයයි.

අපට අවශ්‍ය වන්නේ විද්‍යාව සහ නීතිය සුසංයෝගීව භාවිත කරන විමර්ශන පද්ධතියකි.
මනෝවිද්‍යාත්මක පශ්චාත් මරණ පරීක්ෂණයක් (Psychological Autopsy) යනු මෙම ක්‍රියාවලියේ උච්චතම අවස්ථාව වේ.

මෙම අවස්ථාවේදී අප උත්සාහ කරන්නේ පවතින රජය අපහසුතාවයට පත්කොට පටු දේශපාලන වාසි ලබා ගැනිමට නොව රට හමුවේ අනාවරණය වෙමින් පවතින සංකීර්ණ මෙන්ම භයානක ප්‍රවණතාවය සඳහා රට තුළ අවශ්‍යයෙන්ම පවත්වාගෙන යායුතු නීතියේ ආධිපත්‍ය රාමුව තුළ විසඳුම් සොයා යන ලෙසට පුරවැසි සාමූහිකයක් ලෙස අනුර කුමාර පාලනයට බල කිරීමට බව මෙහිලා අවධාරනය කොට සිටියි.

දිනන දකුණ සාමූහිකය වෙනුවෙන්,

නායකත්ව මණ්ඩල සාමාජික නීතිඥ ශිරාල් ලක්තිලක.
නායකත්ව මණ්ඩල සාමාජික ජනාධිපති නීතිඥ මෛත්‍රී ගුණරත්න.
නායකත්ව මණ්ඩල සාමාජික නදීෂ ද සිල්වා.
මාධ්‍ය ප්‍රකාශක තුෂාර වීරරත්න.